05-10-2019

හිතවත් දෙමව්පියනි,

**නව රථ වාහන සැලැස්ම සහ ආරක්ෂක වැඩ පිළිවෙළ**

**ඒෂියන් ග්‍රැමර් පාසල සහ ගිග්ල්ස් ජාත්‍යන්තර පෙර පාසල**

රටේ උද්ගතව ඇති තත්ත්වය සලකා බලා අප පාසලේ දරු දැරියන් ගුරුවරුන් ඇතුළු කාර්යමණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කරනු වස් විදුහල්පතිනිය ඇතුළු පාසල් පරිපාලනයත්, ආරක්ෂක අංශත් එකතුව විවිධ ක්‍රියාමාර්ග සූදානම් කර ඇත. තවද, ගොතටුව පොලිස් ස්ථානාධිපතිතුමාගේ අණ පරිදි පාසල අසල සිට මීටර 100 දුරට ආරක්ෂිත කලාපයක් ක්‍රියාත්මක වේ.
අපගේ දරුවන්ගේ ආරක්ෂාව සඳහාම එළැඹි මෙම තිරණ වලට ඔබෙගේ පූර්ණ සහයෝගය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

<u>නව රථ වාහන සැලැස්ම</u>

1. පාසල් වේලාව තුළ (පෙ. ව. 6.30 සවස 2.30 දක්වා) පාසල් භූමිය සහ අවට වාහන නවතා තැබීම තහනම් වේ.
2. උදෑසන පාසලට සිසුන් රැගෙන ඒමේදී ඇල්හේන පාරේ සකසා ඇති නව රථ ගාලේ වාහන නවතා ළමුන් පාසලට රැගෙන එන්න.
3. පාසල නිමවූ පසු සිසුන් රැගෙන යාමේදී ඇල්හේන රථ ගාලේ වාහනය නවත්වා පැමිණ, සිසුන් රැගෙන යන්න.
4. පාසල අවට අතුරු මාර්ග වල වාහන නවතා තැබීමෙන් වළකින්න. සුදුසු ස්ථාන වල පමණක් වාහන නැවැත්වීම සිදු කරන්න.
5. සැම විටම ඔබගේ දුරකථන අංකය වාහනයේ, පිටතට පෙනෙන පරිදි තැබීමට කටයුතු කරන්න.
6. බෝගහ හංදිය පාර, පාසල් වාහන සඳහා එක් දිශාවකට පමණක් ධාවනය කල හැකි මාර්ගයක් බවට පත් කෙරේ. එබැවින්, එක් දීශාවකට පමණක් වාහන ධාවනයට දී ඇති උපදෙස් පිළිපදින්න.(බෝගහ හංදිය දෙසින් වාහන ඇතුළු වීම තහනම් වන අතර එය වාහන පිටවීම සඳහා පමණක් භාවිතා කරන්න.)
7. පාසල් වෑන් රථ වල පැමිණෙන සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව එම වාහන හිමියන්ට වෙනම උපදෙස් මාලාවක් ලබා දී ඇත.
8. වාහන තදබදය අවම කර ගැනීමට පාසල ආරම්භ වන මොහොත තෙක් රැඳී නොසිට කල් වේලා ඇතිව දරුවා පාසලට එවීමට කටයුතු කරන්න. 1 වසර සිට 13 වසර දක්වා සිසුන් උදෑසන 6.30 පසුව පාසලට භාර ගනු ලබන අතර පෙරපාසල් සිසුන් උදෑසන 7.30 පසුව පංති වලට යොමුකිරීමට කටයුතු සූදානම් කර ඇත.

9. ත්‍රීරෝද රථ වලින් පාසලට පැමිණෙන සියලු දෙනාටද, ඉහත සියලුම උපදෙස් ක්‍රියාත්මක වනු ඇත.

10. පාසල් භූමිය තුල මෙන්ම Play Group සහ බෝගහ හංදිය අතර ද, ඇල්හේන පාර ආරම්භයේ සිට පාසල් බස් රථ ගාල දක්වා ත්‍රී රෝද රථ නවතා තැබීම සපුරා තහනම් වේ.

11. බෝ ගහ හංදිය අසල සිට, පාසලට සමාන්තර කජුගහවත්ත පාර අසල සිට සහ ඇල්හේන පාර අසල සිට දරුවන්ගේ ආරක්ෂාව සහතික වන පරිදි ආරක්ෂිත වැඩ පිළිවෙළ වල් අනුගමනය කර ඇත. එබැවින් පුද්ගලික වාහන වලින් පැමිණෙන තනිව පාසලට පැමිණිය හැකි සිසුන්ට ඉහත සඳහන් කල ස්ථාන වලින් වුවද බැස පා ගමනින් පාසලට පැමිණිය හැක.

12. උදෑසන ළමුන් භාර දීමට පැමිණෙන විටදී ගේට්ටු අසලින් සිසුන් ආරක්ෂක නිළධාරීන් හට භාර දීමට හැකි වන අතර එය ඉතා ඉක්මණින් සිදුකල යුතුය. ඒ සඳහා අමතර නිළධාරියෙක්ද යොදවනු ලැබේ. මොනයම් හේතුවක් නිසා හෝ වාහන නවතා තැබීමට ඉඩ නොලැබෙන අතර පොලීසිය හා යුධ හමුදා නිළධාරීන්ගේ නියෝග වලට අනුව ඉතා ඉක්මණින් සිසුන් භාරදී පිටවිය යුතුයි. කිසිදු වාහනයකට නවතා තැබීමට අවසර නොලැබේ. (Drop and Go උපදෙස පිළිපදින්න)

13. පාසල් පරිශ්‍රය අවටදී ඔබගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා හැදුනුම්පත පරික්ෂා කල හැකි බැවින් ඒ සඳහා නිවැරදි ජාතික හැදුනුම්පත රැගෙන එන ලෙසද, ජාතික හැදුනුම්පත නොමැතිනම් විදෙස් ගමන් බලපත්‍රය වැනි ආරක්ෂක අංශ පිළිගන්නා සහතිකයක් ළඟ තබා ගත යුතුය.

14. පාසල අවට ආරක්ෂක කලාපය තුළ කිසිවිටෙකවත් නිකරුණේ රැඳී නොසිටින්න

<u>පාසලේ ශිෂ්‍ය ආරක්ෂක සැලැස්ම</u>

1. පෙ. ව. 6.30 ට පෙර කිසිදු සිසුවෙකුට / සිසුවියකට පාසලට ඇතුළු විය නොහැක. ආරක්ෂක කමිටුව විසින් පාසලට ආරක්ෂාව සපයනු ලැබේ.
2. කාර්යාලයෙන් නිකුත් කරනු ලබන අවසරපත නොමැතිව කිසිදු දෙමව්පියෙකුට පාසලට ඇතුළු විය නොහැක.
3. උපන් දින කේක් කැපීම / සියලු ආකාරයේ උත්සව පැවැත්වීම සපුරා තහනම් වේ.
4. පාසලට ඇතුලත් වීමට පෙර සියලුම බෑග් සහ ශරීරය (සංවේදක උපකරණ මගින්) සම්පූර්ණයෙන්ම පරීක්ෂා කරනු ලැබේ.

5. **පාසල නිමා වෙන වේලාව පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| **Play Group 10.45 am** | **Nursery 11.00 am** | **Kindergarten 11.30 am** |
| **Grade 1 - 12.00 noon** | **Grade 2 - 12.15 pm** | **Grade 3 - 12.30 pm** |
| **Grade 4 - 12.30 pm** | **Grade 5 - 12.45 pm** | **Grades 6 & 7 - 1.00 pm** |
| **Grades 8 & 9 - 1.15 pm** | **Grades 10 & 11 - 1.30 pm** | **Grades 12 & 13 - 1.30 pm** |

6 දරුවන් රැගෙන යාමට පැමිණෙන ත්‍රී රෝද රථ රියදුරන් සතුව දරුවාගේ පාසල් හැඳුනම්පත තිබීම අනිවාර්ය වේ

7. දරුවාගේ පාසල් හැඳුනුම් පත නොමැති කිසිම කෙනෙකුට දරුවන් භාරදෙනු නොලැබේ.

8. හදිසි අවස්ථාවකදී දෙමව්පියන් පැමිනෙන තුරු දරුවන්ට පාසල තුල රැදී සිටිය හැක. එවැනි අවස්ථාවකදී අනවශ්‍ය ලෙස කලබල වීමෙන් වැලකී සිටින ලෙස ඉල්ලා සිටිමු.

9. ආරක්ෂක නිලධාරීන් විසින් කෑම පාර්සල් භාරගනු නොලැබේ.

10. සම්පූර්ණ සිරුර ආවරණය වන පරිදි ඇඳුම් ඇද පාසලට නොපැමිණෙන්න.

11. සියලුම අධ්‍යාපන චාරිකා සහ උත්සව අවලංගු කරන ලදී.

12. දරුවා හැකිතරම් අවම පොත් සහ පාසල් උපකරණ ප්‍රමාණයක් සැහැල්ලු බෑගයක රැගෙන ආ යුතු අතර හැකිනම් විනිවිද පෙනෙන බෑගයක් විනිවිද පෙනෙන කෑම පෙට්ටි රැගෙන එන්න. විනිවිද ජේන බෑගය තෝරා ගැනීමේදී අවම පොකට් සහ සිප් (Zipper) සහිත බෑගයක් තොරා ගැනිමට සැලකිලිමත් වන්න. (විනිවිද පෙනෙන බෑග බෝගහ හංදිය අසල සිත්මි වෙළඳ සැලෙන් මිළදී ගත හැක)

කාර්යාලයේ මුදල් ගෙවීම් සදහා හෝ වෙනයම් කටයුත්තකට පැමිණෙන විටදී ඇල්හේන පාරේ රථ ගාල භාවිතා කරන්න.(අත්‍යාවශ්‍ය කරුණක් සදහා පමණක්) අපහසුතා මගහරවා ගැනීම සදහා කාර්යාලය සතියේ දින වල 2.30 - 4.00 දක්වාද සෙනසුරාදා දින 8.30 - 12.00 දක්වාද භාවිතා කල හැකිය.

<u>දෙවන වාරය සදහා පාසල් පටන් ගන්නා සංශෝධිත දිනයන්</u>

Playgroup/Nursery - 2019 මැයි 16

Kindergarten - 2019 මැයි 15

1 – 5 වසර - 2019 මැයි 14

6- 9 වසර - 2019 මැයි 13

පාසල නිමා වීමෙන් පසු දරුවන් පාසලෙන් පිටන ගේට්ටු පහත පරිදි වේ.

## Montessori Section:

**ඇල්හේන පාරට මුහුණ ලා ඇති ගේට්ටුව**

- Nursery : Sunflower, Marigold, Tulip & Carnation
- Kindergarten : Carnation, Marygold, Dahlia,
  Aster, Tulip, Chrysanthemum,
  Zinnia and Rose.
  Lotus, Blue bell, Daisy, Lavender,
  Orchid, Lily, Sunflower

**කාර්යාලය ඉදිරිපිට ඇති ගේට්ටුව**

- Nursery : Rose, Daisy, Lotus, Blue bell, Lavender,
  Dahlia, Lily, Orchid, Zinnia

## Primary Section: (Grade 1 - 13)

**පාසල් රථ ගාලේ ගේට්ටුව (නෙට්බෝල් ක්‍රීඩාංගනය අසල )**

- 1, 2, 6, 7, 8, 9, 10, 11,12 සහ 13 ශ්‍රේණි

**ඇල්හේන පාරට මුහුණ ලා ඇති ගේට්ටුව**

- 3, 4 සහ 5 ශ්‍රේණි

**පාසල් කළමණාකාරීත්වය**

ජ්ෂියන් ග්‍රැමර් පාසල / ගිග්ල්ස් ජාත්‍යන්තර පෙර පාසල

# <u>Security and Safety Rules for Parents</u>

**The decisions below have been taken by the school management after 29.04.2019, the security meeting conducted due to the prevailing situation in the country.**

1. No child will be allowed to enter the school before 6.30am.The school will be on guard by the security committee.

2. All students must be picked up by 2.30pm the latest.

3. Parents are not allowed to enter without an entrance pass which should be obtained by the office.

4. The security committee consists of members of the management, teachers, parents and security officers.

5. No birthday cakes or any other form of celebration is allowed in the premises.

6. All bags will be thoroughly checked before entering the school premises.

7. School will be closing according to the times mentioned below. Please be there to collect the students in the given times.

| | | |
|---|---|---|
| **Play Group 10.45 am** | **Nursery 11.00 am** | **Kindergarten 11.30 am** |
| **Grade 1 - 12.00 noon** | **Grade 2 - 12.15 pm** | **Grade 3 - 12.30 pm** |
| **Grade 4 - 12.30 pm** | **Grade 5 - 12.45 pm** | **Grades 6 & 7 - 1.00 pm** |
| **Grades 8 & 9 - 1.15 pm** | **Grades 10 & 11 - 1.30 pm** | **Grades 12 & 13 - 1.30 pm** |

8. Three wheelers are not allowed into the premises or around the school area. (Parents who are sending their children by three wheelers should ensure that the driver has the proper student ID)
   **Parents who are sending their children by the three wheelers or picked by the three wheelers: The three wheelers will not be allowed to park between play group and the Bo-tree junction. Elhena road up to the school bus park and by roads.**

9. Students will not be handed over to anybody without the student pass.

10. In case of an emergency, children can remain in school until they are picked up in an orderly manner. Please do not rush to the school premises as this will cause unwanted congestion.

11. School vans will be thoroughly checked and allowed to leave the school only after all the students are left.

12. No after school or any extra activities will be held after school except for the most important activities allowed by the school.

13. Students are not allowed to bring any other resources other than the books and relevant stationary.

14. Parents are not allowed to handover food parcels and other parcels to the security persons or the school office.
    (Food should be sent only in a transparent lunch box)

15. .Ladies are not permitted to enter the premise fully covered.

P.T.O

16. All field trips and celebrations for the term are cancelled.

17. Strictly follow the "DROP & GO" instructions.

Thank you for co-operating with the above measures and precautions. Please be assured that we are doing so to ensure the safety of your child within the school premises.

Management




***Sample ID card format for students (Size = ¼ A4 [105 mm x 148 mm])***

* Photo should be taken in School Uniform.

Note : This ID should be in white background with Black letters.

.